

# VASS ගී සර ගී රස 2008 ප්‍රසංගය

## VASS ගී සර ගී රස 2008 ප්‍රසංගය

රුක්මන් විමලසූරිය සහ රෝහණ කරුණාරත්න විසිනි

වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික ගායන ශිල්පී සංගමයේ දෙවන වාර්ෂික සංගීත ප්‍රසංගය ගී සර ගී රස 2008, සැප්තැම්බර් මස 27 වෙනි සෙනසුරාදා සවස 6:00 ට, කිව් හයි ස්කූල්හි රිනයිසන්ස් තියටර් හිදී පැවැත්වේ. පසුගිය වසරේ පැවැති සංගීත ප්‍රසංගය නැරඹීමට පැමිණි ඔබ සැමගෙන් අපට ලැබුණු ප්‍රතිචාර අනුව නව මුහුණුවරකින් තිර රචනය වී ඇති මෙවර ප්‍රසංගයේදී, අපගේම ගී නිර්මාණ වලට අමතරව, ඔබ විසින් කලකට පෙර ශ්‍රී ලංකාවේදී ගුවන් විදුලියෙන් මෙන්ම චිත්‍රපට තුලින්ද අසා රස විඳි ජනප්‍රිය ගීත නැවතත් රස විඳීමට අවස්ථාවක් ලැබෙනු ඇත.

මෙල්බන් පුරයේ ගායනා ප්‍රසංග බොහොමයක් පැවැත්වෙන මෙම දින වල, ඔබගේ පහසුව තකා ප්‍රවේශ පත්‍රයක් ඩොලර් 10 කට මිළ කර ඇත. ටිකට් පත් සඳහා, ශ්‍රී ලාංකික වෙළඳ සැල් වලින් හෝ පහත සඳහන් අයගෙන් විමසන්න. කවදත් ඔබ සැමගේ ගී රස වින්දනය සඳහා ඇප කැප වී සිටින ඔබගේ හිතාදර ගායන ශිල්පීන්ගේ දක්ශතා ඇගයීමටත්, අපව තව තවත් දිරිමත් කිරීමටත්, මෙම මස 27 වෙනි සෙනසුරාදා ඔබ සැම අප හා එක් වනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

රෝහණ කරුණාරත්න 0413 887 161
දයා සිල්වා 9465 6974
රුක්මන් විමලසූරිය 0413 017 302

වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික ගායන ශිල්පී සංගමය බිහි වී දැනට වසර දෙක හමාරකි. මුදල් ඉපැයීම පිණිස නොව, සහජ ගායන හැකියාවත්, ඉන් විඳිනු ලබන අපමණ ආශ්වාදයත්, ඒ සඳහා කෙරෙන කැප වීමත් පදනම් කොටගෙන ගීත ගායනයට පිවිසි අපේම මෙපුර ගායක ගායිකාවෝ බොහොමයක් මෙම සංගමයේ සාමාජිකත්වය හොබවති. රාත්‍රී භෝජන සාදයකදී මිතුරු මිතුරියන් හා එක්ව ගී ගැයීමෙන් පමණක් නොනැවතුනු මොවුන්, තම ගායන හැකියාවන් වැඩි දුරටත් ඔප මට්ටම් කර ගනිමින්, තමන්ගේම ගී නිර්මාණ මෙපුර සංගීත ශ්‍රාවකයින්ට ඉදිරිපත් කළහ. ශ්‍රී ලාංකික සමාජයේ නොයෙකුත් අවශ්‍යතාවන් සඳහා ආධාර මුදල් රැස් කිරීම සඳහා මෙපුර පැවැත්වෙනු ලබන බොහොමයක් සංගීත ප්‍රසංග වල, කිසිම අය කිරීමකින් තොරව කන්කළු ගීත ගායනා ඉදිරිපත් කරන්නේද, මෙපුර වෙසෙන අපගේම ගායක ගායිකාවන්ය.

නවතම ගී නිර්මාණයක් සම්පූර්ණ කිරීම සඳහා බොහෝ විට ශ්‍රී ලංකාවට ගොස් මොවුන් විසින් වැය කරනු ලබන කාලය, ශ්‍රමය සහ ධනය පිළිබඳ වැටහීමක් ඇත්තේ කී දෙනාටද? මෙසේ කෙරෙන නව ගී නිර්මාණ මෙපුර සංගීත ශ්‍රාවකයින්ට රස විඳීමට ඉඩ සලසා දෙන්නේ, ප්‍රධාන වශයෙන්ම මෙපුර ගුවන් විදුලි සහ රූපවාහිනී සේවාවන් මඟිනි. එම වගකීම නොපිරිහෙලා ඉටු කිරීම ගැන, අප ගායන ශිල්පීන්ගේ මෙන්ම සංගීත ශ්‍රාවකයින්ගේත් ස්තුතිය මෙපුර මාධ්‍ය වලට හිමි විය යුතුය. එමෙන්ම, අපගේ නව ගී නිර්මාණ සඳහා පාදක වන ගී පද බොහෝ විට රචනා කොට දෙනු ලබන මෙපුර ගේය පද රචකයින්ටත්, සමහර ගීත වල තනු නිර්මාණය කොට දෙනු ලබන මෙපුර සංගීතඥයින්ටත්, අප සැමගේ ප්‍රණාමය හිමි විය යුතුය.
මෙල්බන් පුරයේ ගායක ගායිකාවන් එකමුතු වී මෙම සංගමය බිහි කිරීමේ අරමුණ වන්නේ, මෙපුර ගායක ගායිකාවන් සහ ඔවුන්ගේ නවතම ගී නිර්මාණ අප සංගීත ශ්‍රාවකයින් වෙත ඉදිරිපත් කොට, ඔවුන්ට එම නිර්මාණ රස වින්දනයට අවස්ථාවක් ලබා දීමයි. වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික ගායන ශිල්පී සංගමය මඟින් දියත් කරන ලද වැඩ කටයුතු කිහිපයක් නම්:

- සංගීතඥ මහින්ද බණ්ඩාර සහ තිස්සසිරි පෙරේරා විසින් මෙහෙයවන ලද සංගීත වැඩමුළුව.
- මෙල්බන් පුරයේ ශ්‍රී ලාංකික මාධ්‍ය වලට සහ එම මාධ්‍ය ආරම්භ කිරීමට පුරෝගාමී වුවන්ට උපහාර තිළිණ පිරිනැමීම.
- ගී සර ගී රස 2007, අප සංගමයේ ප්‍රථම වාර්ෂික සංගීත ප්‍රසංගය.
- සංගීතඥ තරුපති මුණසිංහ සහ වේදිකා, සිනමා සහ ටෙලි නාට්‍ය ශිල්පිණී ගයනි ගිසන්තිකා විසින් මෙහෙයවන ලද ගායන සහ ආංගික පුහුණු පාඨමාලාව.

මෙම මස 27 වෙනි සෙනසුරාදා සවස 6:00 ට, කිව් හයි ස්කූල්හි රිනයිසන්ස් තියටර් හිදී අප සැම හමු වෙමු!

# අපේ පුරෝගාමීන් වෙනුවෙන්

### *උතුරු මෙල්බන් ශ්‍රී ලාංකික වැඩිහිටි සංවිධානය බිහිවෙයි*

අපේ පෙර ගමන් කරුවෝ වැඩිහිටියෝ ය. තරුණ පරපුර දියුණුව කරා පිය මං කරන්නේ වැඩිහිටියන් පෙන්වා දෙන මං සළකුණු ඔස්සේ බව අමුතුවෙන් කිව යුතු නැත . සමස්ථ සමාජයේ උන්නතිය උදෙසා එවන් සේවයක් ඉටු කළ අප වැඩිහිටියන්ගේ ඕනෑ එපා කම් හඳුනාගෙන ඔවුන් ගේ සතුට වෙනුවෙන් කටයුතු කිරීම තරුණ පරපුරේ යුතුකම වෙයි.

දරුවකු මෙලොවට බිහි වූ දා පටන් එම දරුවා සමාජයට වැඩදායී පුරවැසියකු බවට පත් කරන්නට වෙර දරන මාපියෝ ඒ වෙනුවෙන් බොහෝ දේ කැප කරති. තම තරුණ කාලය දරුවන් ඇති දැඩි කරන්නටත් ඔවුනට නිසි අධ්‍යාපනයක් ලබා දෙන්නටත් ඒ සඳහා අත්‍යවශ්‍ය සාධකය වන මුදල් හරි හම්බ කරන්නටත් වෙහෙස වන මාපියන්ට තම ජීවිතයේ තමන්ගේ අවශ්‍යතා සපුරා ගන්නට අවස්ථාව ලැබෙන්නේ කලාතුරකිනි. බොහෝ මාපියන් සතුටු වන්නේ තමන්ට අහිමි වූ බොහෝ දෑ තම දරුවන් හිමි කරගනු දකීමෙනි. එසේ වුවද වියපත් වීමත් සමග පවුලේ මූලිකත්වය දරුවන් අතට පත් කොට විවේක ගන්නට සිදුවන මාපියන්ට තමන් නොදැනුවත්වම හුදකලා ජීවිතයකට කොටු වන්නට සිදුවෙයි. අවිවේකී ජීවිත ගත කරන දරුවන්ට තම මාපියන් සමග ගත කරන්නට කාල වේලාව සොයා ගැනීමම පහසු නැත. නිවසේ කාලය ගෙවන තම මාපියන් කරදර වලින් නිදහස්ව විවේක සුවයෙන් පසුවනු ඇතැයි දරුවෝ සිතති.

එසේ වුවද කාලාන්තරයක් තිස්සේ තමන් ජීවත් වූ කාර්ය බහුලත්වයෙන් මිදුණු විට රැකියාවෙන් විශ්‍රාම ලැබූ විට තව දුරටත් තම සේවය අන් අයෙකුට අවශ්‍ය නොවේ යයි හැඟෙන විට යමෙකුට දැනෙන හිස් බව සහ මානසික පසුබෑම වටහා ගැනීමට හැකි වනුයේ එම තත්වයේ පසුවන තවත් අයෙකුට පමණි. එය රෝගී තත්වයකට පවා හේතුකාරකයකි. ශ්‍රී ලංකාවේ දී නම් වැඩිහිටියනට රිසි සේ ගමන් බිමන් යන්නට නෑ හිතවතුන් හා කාලය ගත කරන්නට ආගමික කටයුතු වල නියැලෙන්නට ඕනෑ තරම් අවස්ථා තිබේ. එහෙත් විදේශ රටක ජීවත් වන වැඩිහිටියනට එවැනි අවස්ථා සීමිත බව අමුතුවෙන් කිව යුතු නැත. මෙම අඩුව හඳුණාගත් ඕස්ට්‍රේලියාවේ වෙසෙනෙ ශ්‍රී ලාංකිකයන් තමන් වෙසෙන ප්‍රදේශ වල ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් වෙන්වූ සංවිදාන පිහිටුවාගෙන යම් යම් ප්‍රයෝජනවත් කාර්යයන්හි නිරත කරවීමට දරන වෑයම අගය කළ යුතුයි.

උතුරු වික්ටෝරියානු ප්‍රදේහයට මෙතෙක් අඩුවක්ව පැවති ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානයක් පිහිටුවාග න්නට හැකි වීම එම ප්‍රදේශයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සතුටට කරුණක්. දිගු කාලීන සැළසුමකින් යුතුව ඒ සඳහා ඇප කැප වූ පුෂ්පා ජයකොඩි මහත්මියගේත් ඊට සහය දුන් කර්නල් කුඩලිගම මහතා සහ ආචාර්ය ප්‍රේමා කුඩලිගම මහත්මියගේත් උත්සාහයන් මල්ඵල ගන්වමින් පසුගිය ජූලි 27 වන දා ලේලෝහි වැඩිහිටි සංවිධාන ශාලාවේදී උත්සවාකාරයෙන් ආරම්භ වූ උතුරු වික්ටෝරියානු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානයට පළමු දිනයේදීම විශාල සාමාජිකත්වයක් බඳවා ගැනීමට හැකි වීම එහි ඉදිරි ගමනේ සාර්ථකත්වය පෙන්නුම් කරන පෙරමග ලකුණක් බව කිව හැකිය. විවිධ ක්ෂෙත්‍රයන්හි අත්දැකීම් සහ දක්ෂතා ලැබූවන්ගෙන් සමන්විත වූ කාරක සභාවක් මෙම සංවිධානය මෙහෙයවනු ලබයි. ඊට පුෂ්පා ජයකොඩි ආචාර්ය ප්‍රේමා කුඩලිගම හිමාලි කරුනාසේන සදා රණසිංහ ස්වර්ණා ප්‍රඥාරත්න ශ්‍රීනාත් මද්දුමගේ දයා සිල්වා ආනන්ද ලොකුලියනගේ රන්ජන් ජයලත් හේමචන්ද්‍ර විතාරණ යන මහත්ම මහත්මීන් ඇතුළත් වන අතර කර්නල් ස්ටීවන් කුඩලිගම මහතා උපදේශකත්වයෙන් දායක වෙයි. විට්ල්සී කවුන්සිලයේ සහය ලබාගෙන ක්‍රියාත්මක් වන මෙම සංවිධානය ඉදිරියේදී විවිධ වැඩ සටහන් රැසක් ක්‍රීයාත්මක කිරීමට අපේක්ෂා කරයි.

දුරකතන අංක 03 9404 4199 ඔස්සේ පුෂ්පා ජයකොඩි මහත්මිය ඇමතීමෙන් උතුරු මෙල්බන් ශ්‍රී ලාංකික වැඩිහිටි සංවිධානය පිලිබඳ වැඩි දුර විස්තර ලබා ගැනීමට ඔබට හැකි ය.




GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila